# කොළඹ දිසා අධිකරණයේදීය.

නිහාල් ශ්‍රී අමරසේකර,
අංක. 167/4, ශ්‍රී විපුලසේන මාවත,
කොළඹ - 10.

පැමිණිලිකරු

නඩු අංකය :- 21819/එම්.ආර්
ස්වභාවය :- මුදල් අයකර ගැනීම.
වටිනාකම :- රු. 100,000,000/-
කාර්ය පටිපාටිය :- සාමාන්‍ය

එදිරිව

1. ගාමිණී ලක්ෂ්මන් පීරිස්,
"විසුම්පාය", ස්ටේපල්ස් වීදිය,
කොළඹ - 2 සහ අංක. 37,
කිරුළ පෙදෙස, කොළඹ - 5.

2. හොවෙල් ඩිවෙලොපර්ස්(ලංකා)ලිමිටඩ්,
කොළඹ හිල්ටන් ක්‍රීඩා සංකීර්ණය
බාරේ, එච්ලන් චතුරශ්‍රය, ලෝටස්
පාර, කොළඹ - 1.

විත්තිකරුවන්

වර්ෂ 1998 ක්වූ ඔක්තෝබර් මස 27 වන දින දීය.

ස්වකීය නීතිඥවරයා වන **"ද සිල්වා සහ පෙරේරා"** යන නාමය හා විලාශය යටතේ වෘත්තියෙහි යෙදෙන **ජේ.ඩබ්ලිව්.ඩී.පෙරේරා මහතා** මගින් පෙනී සිටින ඉහත නම සඳහන් පැමිණිලිකරුගේ පැමිණිල්ලෙහි මෙසේ ප්‍රකාශ කර සිටී :-

1. ඉහත නම් සඳහන් පැමිණිලිකරු සහ 1 වන විත්තිකරු පදිංචිව සිටින්නේ ද, ඉහත නම සඳහන් 2 වන විත්තිකාර සමාගමේ ලියාපදිංචි කළ කාර්යාලය පිහිටා ඇත්තේ ද, මෙහි මින්මතු සඳහන් කරනු ලබන නඩු නිමිත්ත උද්ගත වූයේ ද, මෙම අධිකරණයේ අධිකරණ බලසීමාව ඇතුළතය.

2. පැමිණිලිකරු,

   i ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සහ එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ අධි සාමාජිකයකු ද වෙයි.

   ii 1994/09/21 දින සිට 1995/09/20 දින දක්වා මුදල් අමාත්‍යාංශයේ උපදේශකයකු වූ අතර, එහි දිගටම රැඳී සිටීමට කැමැත්තක් නොදැක්විය.

(iii)/

iii 2 වන විත්තිකාර සමාගමේ කොටස්හිමියකු සහ අධ්‍යක්ෂවරයකු වේ.

3. 1 වන විත්තිකරු :

(i) මීට කලින් එක් කලෙක දී කොළඹ විශ්වවිද්‍යාලයේ නීතිය පිළිබඳ මහාචාර්යවරයා සහ එහි උපකුලපතිවරයා ද, විය.

(ii) පසුගිය එක්සත් ජාතික පක්ෂ රජය යටතේ ජනසවිය භාර අරමුදලේ උප සභාපති, ජනාධිපති තරුණ කොමිෂන් සභාවේ, නීති කොමිෂන් සභාවේ, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සහ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස ද, සිට ඇත.

(iii) දැන් පොදු ජන එක්සත් පෙරමුණේ ජාතික ලැයිස්තුවෙන් පත් වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වන අතර වත්මන් රජයේ නියෝජ්‍ය මුදල් අමාත්‍ය, සහ අධිකරණ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු, ජනවාර්ගික කටයුතු හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා ද වේ.

4. (අ) 2 වන විත්තිකාර සමාගම වූ කලී 1983/03/15 දින හෝ ඊට ආසන්න දිනකදී සංස්ථාගත කරන ලද කොළඹ ව්‍යාපාර වස්තු ස්ථානයෙහි ලැයිස්තුගත පොදු සමාගමක් වන අතර, කොළඹ හිල්ටන් හෝටලයේ අයිතිකරු වේ.

(ආ) 2 වන විත්තිකාර යමාගමේ රු.මිලියන 452.26 ක කොටස් ප්‍රාග්ධනයෙන් 65% ක් ශ්‍රී ලංකා රජයට ද, 27% ක් (මෙහි මින්මතු "මිට්සුයි හා තායිසේ" යනුවෙන් සඳහන් කරනු ලබන) ජපානයේ "මිට්සුයි ඇන්ඩ් කම්පැනි ලිමිටඩ්" හා "තායිසේ කෝපරේෂන්" යන සමාගම් දෙකට සහ 8% ක් මහජනතාවට ද අයත් වේ.

(ඇ) 2 වන විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂවරයන් 11 දෙනාගෙන් 6 දෙනෙක් රජය විසින් නම්කර පත් කරනු ලැබේ.

(ඈ) හෝටලය ගොඩනැගීම සඳහා 2 වන විත්තිකාර සමාගම විසින් ලබාගෙන ඇති විදේශීය ණය වෙනුවෙන් රජය 2 වන විත්තිකාර සමාගම වෙනුවෙන් මිට්සුයි හා තායිසේ සමාගම් වලට ඇපකරයන් නිකුත් කර ඇත.

5. කොටස් බහුතරයක් රජයට අයිති සහ රජය විසින් පාලනය කරන ලද 2 වන විත්තිකාර සමාගමේ අයිතිවාසිකම් සහ එහි කොටස්හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම පිණිස අවශ්‍ය කරන පරිදි, 2 වන විත්තිකාර සමාගමේ කටයුතු කළමනාකරණය සහ පාලනය කළ අය කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීම පැහැර හැරීමේ සහ අනපසු කිරීමේ අවස්ථානුගත හේතු නිසා, 2 වන විත්තිකාර සමාගමේ කොටස්හිමියකුගේ තත්ත්වයෙන් එවකට අධ්‍යක්ෂවරයකුව සිටි පැමිණිලිකරු විසින්, 2 වන විත්තිකාර සමාගමේ අයිතියෙන් සහ එය උදෙසා සහ එය වෙනුවෙන්, එම හෝටලය හා සම්බන්ධයෙන් 1990/09/13 වන දින කොළඹ දිසා අධිකරණයේ අංක.3155/විශේෂ දරන ව්‍යුත්පන්න නඩුව පවරන ලදී.

6./

6. වෙනත් දේ අතර "2 වන චිත්‍රකාර සමාගමෙන් හා රටෙන් අති විශාල විදේශ විනිමය ප්‍රමාණයක් වක්‍ර ලෙස වෙනත 'කට හරවා යැවීම වැළැක්වීම පිණිස ඒවා නිකුත් කර ඇති බවත්, පෙන්නුම් කර ඇති අවස්ථානුගත කරුණු අනුව, ප්‍රධාන කොටස්කරු සහ ඇපකරු ලෙස, රජයට මේ කාරණයේදී උදාසීනව සිටිය නොහැක" යනුවෙන්ද නිරීක්ෂණය කරමින්, දිසා අධිකරණය විසින් කොළඹ දිසා අධිකරණයේ අංක.3155/විශේෂ දරන නඩුවේදී නිකුත් කරන ලද අතුරු ඉන්ජන්ෂන් තහනම් නියෝග ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 92/12/02 වන දින ස්ථිර කරන ලදී.

7. (අ) එහි ප්‍රතිඵලයක් වශයෙන් නීතිපතිවරයා භාණ්ඩාගාරයේ ලේකම්වරයා ද, රජය නියෝජනය කරමින්, රජය සහ 2 වන චිත්‍රකාර සමාගමේ ප්‍රධාන කොටස්හිමියා සහ ඇපකරු වශයෙන්, සමථයක් ඇති කරන ලදී.

(ආ) කොළඹ දිසා අධිකරණයේ අංක.3155/විශේෂ දරන නඩුවේදී 2 වන චිත්‍රකාර සමාගම නියෝජනය කල නීතිපතිවරයා විසින් 1993 ජූනි සිට කටයුතු සමාප්ත කර තිබුණු පරිදි වූ සමථ ගිවිසුම් 95/06/28 වන දින ලියා අත්සන් කරන ලදී.

(ඇ) රජය එම සමථ ගිවිසුම් වලට පාර්ශවකරුවකු වීමෙන්, රජය වෙනුවෙන්, ඒවා භාණ්ඩාගාරයේ ලේකම් විසින් අත්සන් කරන ලදී.

(ඈ) සමථය අනුමත කිරීමට යෙදුනු 95/06/21 දින දරන අමාත්‍ය මණ්ඩල සංදේශයෙහි වෙනත් දේ අතර, මෙසේ සඳහන් විය : "මීට අදාල සම්පූර්ණ කාරණා ගැන විශේෂ ජනාධිපති කොමිෂන් සභාවක් විසින් පරීක්ෂණ කටයුතු කරගෙන යනු ලබන අතර, ඒ පිළිබඳ වාර්තාවක් රජයට සහ මහජනතාවට ද, ලබා දෙනු ඇත. කොමිෂන් සභාවේ තීරණ සහ නිර්දේශ පදනම් කරගෙන සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීම රජය විසින් සලකා බලනු ඇත. සොලිසිටර් ජනරාල්වරයා විසින් මේ සමථය ගැන කොමිෂන් සභාව දැනුවත් කර ඇත."

8. සමථ ගිවිසුම් අත්සන් කිරීමට කලින් 1992 සිට පැවති ගිවිසුමේ කෙටුම්පත් සහ ඒවාට අදාළ ලිපි ගනුදෙනු හා ලේඛන, 95/06/28 දින අත්සන් කිරීම සඳහා නීතිපතිවරයා වෙනුවෙන් සමථ ගිවිසුම් අනුමත කල සොලිසිටර් ජනරාල්වරයාගේ මාර්ගයෙන්, ඊනියා "හිල්ටන් ප්‍රෝඩාව" ගැන විභාග කිරීමට පත් කරන ලද විශේෂ ජනාධිපති කොමිෂන් සභාවේ ප්‍රසිද්ධ විමසීම් හමුවෙහි පැමිණිලිකරු විසින් තබන ලදී.

9. (අ) මිට්සුයි හා තායිසේ විසින් 2 වන චිත්‍රකාර සමාගමේ ඉල්ලා සිටින ලද මුදල් වලින් මිට්සුයි සහ තායිසේ සමාගම් විසින් ජපන් යෙන් මිලියන 17586 (රු.මිලියන 10,200) ක මුළු ප්‍රමාණයක කපා හැරීමක් වන අවුරුදු 10 ක පොලිය සහ මුල් මුදලින් 30% ක මුදලක් ද, කපා හැරීමකින් යුතුව වූ සමථය 2 වන චිත්‍රකාර සමාගමට රජයට අභිවෘද්ධිදායක විය.

(ආ)/

(ආ) පැමිණිලිකරු විසින් ලබා ගන්නා ලද අතුරු තහනම් නියෝග හේතුකොට ගෙන 2 වන විත්තිකාර සමාගම වෙත එකතු වූ මුදල් වලින්, ජපන් යෙන් මිලියන 2312 ක මුදල ගෙවීමෙන් පසු, ගෙවිය යුතු ඉතිරි මුදල, ජපන් යෙන් මිලියන 7334 වන ලෙසටත්, එය අවුරුදු 1 ක ක්ෂමා කාලයක්ද ඇතිව, (කලින් 1999 වන විට 6% ක පාර්ශ්වික පොලියක් සහිතව ගෙවිය යුතුව තිබුනද) වර්ෂ 2010 දක්වා තෙක් අවුරුදු 15 ක කාලයකින් වර්ෂයකට 5.25% පොලියක් සහිතව ගෙවීමට එකඟ විය.

(ඇ) 2 වන විත්තිකාර සමාගමට, රජයට සහ මහජනතාවට ද, එවැනි ලාභ ප්‍රයෝජන ලබා ගැනීමට සමත් වූයේ, සම්බන්ධ පාර්ශවකරුවන්ගේ බලපෑම් හා බාධා මධ්‍යයේ තනිකරම පැමිණිලිකරු විසින් දරන ලද උත්සාහයන්වල ප්‍රතිඵලයක් වශයෙනි.

10. 1 වන විත්තිකරු විසින් 95/06/30 වන දිනට කැඳවන ලද සහ ඔහු විසින් මූලාසනය දරන ලද පුවත්පත් සාකච්ඡාවක දී, සමථය ප්‍රකාශයට පත් කරමින්, වෙනත් දේ අතර, 1 වන විත්තිකරු විසින් මෙසේ ප්‍රකාශ කර සිටින ලදී :-

"විශාල පරිමාණයේ ඉතිරියක් ගෙන දුන් ජපන් කොන්ත්‍රාත්කරුවන් සමග අත්සන් කරන ලද සමථය ජාතික සම්පත් කොල්ලකෑම හා පැහැර ගැනීම මර්දනය කිරීමේ පොදු ජන එක්සත් පෙරමුණු ආණ්ඩුවේ මැතිවරණ ප්‍රකාශයේ ප්‍රධාන අංගයට සහ රජයේ බැදියාවට අනුකූලතාවයක් දැක් වේ. කෙසේ වෙතත් මෙම සමථය විශේෂ ජනාධිපති කොමිෂන් සභාව විසින් සහ අල්ලස් සහ දූෂණ පිළිබඳ ස්ථිර කොමිෂන් සභාව විසින් වරදකරුවන්ට විරුද්ධව ගනු ලබන නීත්‍යානුකූල දණ්ඩකාරක නඩු කටයුතු වලට කිසිදු සම්බන්ධතාවක් නැත."

11. පැමිණිලිකරු විසින් කරන ලද නීත්‍යානුකූල පැමිණිලි මත, නීතියෙන් අවශ්‍ය වන පරිදි (1 වන විත්තිකරු විසින්ම ප්‍රකාශ කර ඇති පරිදි) "ජාතික සම්පත් කොල්ලකෑම හා පැහැර ගැනීම" වැළැක්වීම සඳහා, ව්‍යවස්ථාපිත කාර්ය භාරයන්, බැදීම් සහ වගකීම් වුවමනාවෙන්ම සහ හිතාමතාම පැහැර හැරීම, සම්බන්ධයෙන් 1 වන විත්තිකරුද ඇතුළත් වූ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ එවකට සිටි සාමාජිකයන්ට විරුද්ධව, ක්‍රියා කිරීමට රජය එකඟ වී ඇති බවට කොන්දේසියක් 1993 ජූනි මස සිට සමාප්ත කිරීමට යෙදුනු සමථ ගිවිසුම්වල, නීතිපතිවරයා විසින් තීරණය කරනු ලැබ ඇති පරිදි, අඩංගු විය.

12. (අ) (i) වත්මන් රජයේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 94/09/23 දාතමින් යුත් ලිපියක් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත යවමින්, කොළඹ දිසා අධිකරණයේ අංක.3155/විශේෂ දරන නඩු තීන්දුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අහිත කර නිරීක්ෂණ කර ඇති බවත්, මුදල් අමාත්‍යවරයා විසින් කාරණය සමාලෝචනය කරනු ලැබ ප්‍රතිකර්ම යෙදීමට ක්‍රියා කරන ලෙස ඉල්ලා ඇති බවත්, එබැවින් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමේ අරමුණින් මෙම කරුණ විමර්ශණය කරන ලෙසත් දන්වා සිටින ලදී.

(ii)/

(ii) භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වශයෙන් එම කොමිෂමේ සාමාජිකයකු වන බී. වයි. ලියනගේට මෙම ලිපියේ පිටපතක් යවා ඇත.

(ආ) එම කොමිෂමේ සභාපතිවරයා විසින්, 94/10/06 දින දරන ලිපිය මගින්, මෙම කාරණය කොමිෂම හමුවට පැමිණවීමට එකඟ වන ලදුව, සංශෝධිත පරිදි වූ 1987 අංක. 36 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ විධිවිධාන යටතේ, කාරණය ගැන විමසා තීරණයකට එළඹීම සඳහා සාමාජිකයන් 3 දෙනෙකුගෙන් යුත් කමිටුවක් පිහිටුවන ලද බවත්, බී. වයි. ලියනගේ මහතා එහි එක් සාමාජිකයකු වූ බවත්, පැමිණිලිකරු තදින්ම විශ්වාස කරයි.

(ඇ) පැමිණිලිකරුගේ දැනුමේ හැටියට පරීක්ෂණයක් නොපවත්වන ලද අතර, මේ සම්බන්ධයෙන් එම කොමිෂම වෙත අනතුරුව යවන ලද ලිපි වලට පිළිතුරු එවීම පවා කොමිෂම විසින් පැහැර හැර සහ අතපසු කර ඇත.

13. (අ) සමථ ගිවිසුම්වල, 1 වන විත්තිකරුද ඇතුළත් සුරැකුම්පත් සහ විනිමය කොමිෂමේ සාමාජිකයන්ට බලපාන කොන්දේසියක් ඇතුළත්ව තිබෙන බව හෙළිදරව් වීමෙන් පසු, ඒ කොන්දේසියෙන් තමාට බලපෑමක් සිදුවී තිබියදී, ස්වකීය පුද්ගලික යහපත උදෙසා ක්‍රියා කරමින්, 1 වන විත්තිකරු විසින්, නියෝජ්‍ය මුදල් ඇමති පදවිය සහ අධිකරණ හා ව්‍යවස්ථා කටයුතු ඇමති පදවිය දරමින් එකී පදවි වැරදිලෙස හා අනිසිලෙස යොදා ගනිමින්, ඉතා සැලකිය යුතු ආපසු හැරීමකින් යුතුව, මහජන ආන්දෝලනයක් ඇති කරමින් 95/06/28 වන දින අත්සන් කරන ලද සමථ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම සාවද්‍ය සහ නීතිවිරෝධී ලෙස අත්හිටුවීම සැලැස්වීමට 95/07/24 වන දින මැදිහත් විය.

(ආ) මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 95/07/24 වන දින දරන ලිපිය මිට්සුයි හා තායිසේ සමාගම් වෙත යවමින්, විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ විමසීම්වල තීරණයක් ලැබෙන තුරු සමථ ගිවිසුම් ක්‍රියාත්මක නොකරන බව ඔවුනට දැන්වීමට 1 වන විත්තිකරු විසින් තමාට නියෝග කර තිබෙන බව දන්වා සිටින ලදී. 1 වන විත්තිකරු විසින්ද මේ අයුරින් මහජනයා වෙතද ප්‍රසිද්ධ ප්‍රකාශයක් කර සිටින ලදී. 95/07/24 වන දින සමථ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම අත්හිටවීමට 1 වන විත්තිකරු සාවද්‍ය ලෙස හා නීතිවිරෝධී ලෙස මේ අයුරින් මැදිහත් වී ඇත.

14. (අ) පාර්ලිමේන්තු මන්ත්‍රී මහින්ද සමරසිංහ විසින් අසන ලද ප්‍රශ්ණ වලට උත්තර දෙමින්, රජයට පිළිගත නොහැකි කොන්දේසි ගණනාවක් ඒවායේ ඇතුළත්වීම හේතුකොට ගෙන, සමථ ගිවිසුම් අත්හිටවීම මැදිහත් වූයේ තමා බව 1 වන විත්තිකරු පාර්ලිමේන්තුවේදී 95/08/08 වන දින පිළිගත්තේය.

15. සමථ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම 1 වන විත්තිකරු විසින් සාවද්‍ය හා නීතිවිරෝධී ලෙස අත්හිටවීමේ ප්‍රතිඵලයක් වශයෙන් 2 වන විත්තිකාර සමාගමට :

(අ) නියමිත දිනයන්හිදී මිට්සූයි සහ තායිසේ සමාගම් වලට ගිවිසගත් ගෙවීම් කිරීමට නොහැකි වීම මගින්, 2 වන විත්තිකරුට අතිරේක පොලී ගෙවීමට සිදුවිය ;

(ආ) සමථ ගිවිසුම්වල පහත දැක්වෙන කොන්දේසියේ නියමයන් ප්‍රකාර එලෙස මූල්‍ය කටයුතු ප්‍රතිව්‍යුහකරණය කිරීමට සහ ස්වකීය ලාභදායිතාවය හා ණය සේවා කිරීමේ ශක්තිය වැඩිදියුණු කිරීම පිණිස හෝටල් කාමර සහිත 3 වන කුළුණ ඉදි කිරීමට, විශේෂයෙන් ඉඩ සලසා දුන් 1995 ජූලි සිට 1996 ජූනි දක්වා වූ 1 අවුරුදු ක්ෂමා කාලය තුළදී, නොහැකි විය :-

ගිවිසුම් අංක. 2 - "14. එකී ණය මුදල් මිට්සූයි සහ තායිසේ සමාගම් වලට සහ/හෝ ඉහත කී පරිදි ආණ්ඩුවට ණය මුදල් ආපසු ගෙවීමට හැකිවනු වස්, එච්ඩීඑල් සමාගමේ (2 වන විත්තිකාර සමාගමේ) ලාභදායිතාව වැඩිකර ගැනීම පිණිස, එච්ඩීඑල් සමාගම විසින් හෝටලයෙහි හෝටල කාමර වලින් යුත් 3 වන කුළුණු ගොඩනැගිල්ලක් සෑදීමට ඇති හැකියාව ගැන සහ සුදුසු යයි හැඟෙන ආකාරයට හිමිකම් නිකුතුවක් සහ/හෝ එහි අළුත් කොටස් නිකුතුවක් මගින් එහි වියදම සඳහා මුදල් යෙදවීමේ හැකියාව ගැන එච්ඩීඑල් සමාගම විසින් සොයා බැලිය යුතුය සහ බලනු ලබන්නේය."

(ඇ) ඉහත සඳහන් කාරණයෙහි ප්‍රතිඵලයක් වශයෙන්, තවදුරටත් පොලී වියදම්ද දරමින් 1997 ජූලි මාසයේදී, ඇපකරු වශයෙන් රජයෙන් තවත් රු. මිලියන 288.567 ක මුදල් ණයට ගැනීමට සිදුවිය ;

(ඈ) ජපන් යෙන්හී ක්ෂයවීමේ වාසිය ලබා ගැනීම පිණිස, නොකපාහැරි ණය මුදලේ ඉතිරිය ජපන් යෙන් වලින් ඇමරිකන් එක්සත් ජනපද ඩොලර් වලට පරිවර්තනය කර ගැනීම වළක්වනු ලැබ ඇත.

16. (අ) ජනාධිපති කුමාරතුංග මැතිණිය/මුදල් ඇමතිණිය සහ පැමිණිලිකරු අතර 1996 මාර්තු මසදී සාකච්ඡා වලින් අනතුරුව, අත්සන් කර තිබූ සමථ ගිවිසුම් 1996 මාර්තුවේදී ක්‍රියාත්මක කිරීමට යෙදුණි.

(ආ) ඉන්පසු 2 වන විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, සමථ ගිවිසුම්වල නියමයන් ප්‍රකාර 96/10/25 දින ගෙවීම් අනුමත කොට මිට්සූයි සහ තායිසේ සමාගම් වලට පොරොන්දු නෝට්ටු නිකුත් කරන ලදී.

(ඇ) භාණ්ඩාගාරයේ ලේකම්ගේ හා නීතිපතිවරයාගේ නියමය පරිදි, අත්සන් කරන ලද සමථ ගිවිසුම් වලට 1996 සැප්තැම්බරයේදී/ඔක්තෝබරයේදී එකතු කරන ලද පරිච්ඡේදයක් මගින් 1 වන විත්තිකරුද ඇතුළත්, සූරකුම්පත් සහ විනිමය කොමිෂමේ සාමාජිකයන්ට විරුද්ධව බලපෑ එකී කොන්දේසිය පමණක් බැහැර කිරීමට යෙදුණි.

(ඈ)/

(ඈ) එකී පරිශිෂ්ඨයෙන්, 2 වන විත්තිකාර සමාගමේ සහ රජයේ ද අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට සමථ ගිවිසුම්වල අනිකුත් සියලු කොන්දේසි ක්‍රියාත්මක කිරීම සහතික කිරීම හා සුරක්ෂිත කිරීමට කටයුතු යෙදීමට විධිවිධාන සලස්වා ඇත.

(ඉ) 1995 දී සමථ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම අත්හිටවීම සිදු කරමින් 1 වන විත්තිකරු විසින් ප්‍රකාශ කරන ලද දේවල් වලට ප්‍රතිවිරුද්ධව, විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂමේ කටයුතු අවසාන වීමට කලින්, 1 වන විත්තිකරු විසින් ඒ ගැන කිසිදු ප්‍රසිද්ධ ප්‍රකාශයක් කිරීමෙන් තොරව, 1996 දී එකී සමථ ගිවිසුම් ක්‍රියාත්මක කරනු ලැබීය.

17. (අ) 96/12/13 වන දින හැන්සාඩ් වාර්තාවට අනුව, පාර්ලිමේන්තු මන්ත්‍රී රවි කරුණානායක විසින් අසන ලද ප්‍රශ්ණ වලට පිළිතුරු දෙමින්, මිලියන 10,624 ක කපා හැරීමක් සහිතව ගිවිසගත් ඉතිරි ණය වර්ෂ 2010 දක්වා දීර්ඝ කරමින් (කලින් 1999 වන විට මුළුමනින්ම ගෙවා තිබිය යුතු විය) 2010 වසර දක්වා අවුරුදු 15 ක් ඇතුළත ගෙවීමට ඉඩ සැලසීම රටට අර්ථලාභී බව ඔහු විසින් පිළිගනිමින්, 1 වන විත්තිකරු විසින් සමථය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රකාශයක් පාර්ලිමේන්තුවෙහි සභාගත කරන ලදී.

(ආ) එනමුත් එවැනි ප්‍රතිලාභ අත්කර ගන්නා ලද්දේ පැමිණිලිකරුගේ වෑයම් හා ක්‍රියාවල පමණක් ප්‍රතිඵල වශයෙන් වුවත් 1 වන විත්තිකරු විසින් එය කිසිදිනෙක පිළිගෙන නැත.

18. එසේ කිරීම සඳහා කිසිදු නෛතික පදනමක් නොමැතිව, 1 වන විත්තිකරු විසින් සිදු කරන ලද සමථ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම සාවද්‍ය ලෙස සහ නීතිවිරෝධී ලෙස මුළුමනින්ම අත්හිටවීම 2 වන විත්තිකාර සමාගමටද, රජය හා පැමිණිලිකරු ඇතුළු එහි කොටස්හිමියන්ටද මහජනතාවටද අහිතකර ක්‍රියාවක් වූ අතර, එයින් ඔවුනට පාඩු හා අලාභ හානි සිදු විය.

19. 1 වන විත්තිකරු විසින් සමථ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම සාවද්‍ය හා නීතිවිරෝධී ලෙස අත්හිටවීම සිදු කිරීම හේතුකොට ගෙන :-

(අ) (i) ලේකම්වරුන් විසින් 97/09/23 වන දින බෙදා හරින ලද 2 වන විත්තිකාර සමාගමේ ක්‍රියාකාරී ගිණුම්වල අනාවරණය කර ඇති පරිදි, 2 වන විත්තිකාර සමාගම මිලියන 79,629 ක අතිරේක පොලී දැරීමට සිදුවිය ;

(ii) පොලී ආදායම 2 වන විත්තිකාර සමාගම සමග වන ශ්‍රී ලංකා රුපියල් වලින් සහ ජපන් යෙන් තැන්පතු වලින්, ගණන් ගැනීමේදී, 2 වන විත්තිකාර සමාගමට සිදු වූ අලාභය රු.මිලියන 35.938 ක් ලෙස සැලකිය හැක ;

(ආ)/

(ආ) (i) සමර් ගිවිසුම්වල විශේෂයෙන් ඉඩ සලසා ඇති පරිදි, 95 ජූලිවල සිට දී තිබූ එක් අවුරුදු ක්ෂමා කාලය තුළ කරගෙන යායුතු බවට අපේක්ෂා කර තිබුණු 2 වන විත්තිකාර සමාගමේ ලාභදායිතාවය හා ණය සේවා කිරීමේ ශක්තිය වර්ධනය කිරීම පිණිස 3 වන හෝටල් කාමර කුළුණක් සෑදීමට තිබුණු හැකියාව අහිමිවීම ද ඇතුළුව 2 වන විත්තිකාර සමාගමේ මූල්‍ය ප්‍රතිව්‍යුහකරණය කිරීම කළ නොහැකි විය. කළමනාකාර සමාගම වන හිල්ටන් ඉන්ටර්නැෂනල් සමාගම විසින් ජේඒඅයිසී (JAIC) කුළුණු කළමනාකරණයට ගැනීම අලෙවි ශක්තිය බාල කිරීමක් වූ අතර,

(ii) ඉහත සඳහන් කාරණයෙහි ප්‍රතිඵලයක් වශයෙන්, 2 වන විත්තිකාර සමාගමට දිගින් දිගටම අඛණ්ඩව, පාඩු සහ අලාභ හානි සිදු වූ අතර ඒවා දිගටම සිදුවෙමින් පවතී.

(ඇ) (i) ඉහත (ආ) (i) හි ප්‍රතිඵලයක් වශයෙන්, 97/11/07 වන දින ලේකම්වරුන් විසින් බෙදා හරින ලද 2 වන විත්තිකාර සමාගමේ ක්‍රියාකාරී ගිණුම් වලින් අනාවරණය කරන පරිදි, 2 වන විත්තිකාර සමාගමට ඇපකරු වශයෙන් සිටින රජයෙන් රු.මිලියන 288.567 ක මුදලක් 1997 ජූලි මසදී ණයට ගැනීමට සිදුවුනු අතර, භාණ්ඩාගාරයේ ලේකම් විසින් 2 වන විත්තිකාර සමාගම වෙත යවන ලද 97/11/13 දිනැති ලිපිය අනුව, එම ණය මුදල වර්ෂ 2001 ජූලි මස 01 වන දිනෙන් ආරම්භව අවුරුදු 5 ක කාලයක් ඇතුළත වර්ෂයකට 12.5% ක පොලියක්ද සමග සම වාරික වලින් එක් එක් අවුරුද්දේ ජූනි මාසයේදී ආපසු ගෙවිය යුතු විය.

(ii) ඉහත (ආ) (i) හී ප්‍රතිඵලයක් වශයෙන්, පොලී වශයෙන් තවදුරටත් පාඩු විඳිමින්, එකී ලිපියේ නියමයන්ට පටහැනිව, රජයෙන් තව තවත් මුදල් ණයට ගැනීමට 2 වන විත්තිකාර සමාගමට අනිවාර්යයෙන්ම සිදුවනු ඇත.

(iii) ඉහත සඳහන් කරුණු නිසා, නීතිපතිවරයා වෙත සහ රජයේ නාමික අධ්‍යක්ෂවරයන් වෙත යවන ලද 94/10/19 වන දින දරන ලිපිය පරිදි, 2 වන විත්තිකාර සමාගම විසින් මිට්සුයි සහ තායිසේ සමාගම් වලට ණය මුදල් ආපසු ගෙවීමට අවකාශය සලසමින්, මූල්‍ය ප්‍රතිව්‍යුහකරණය කිරීමට සහ ණය ප්‍රතිලේඛනගත කිරීමට යටත්ව, මිට්සුයි සහ තායිසේ සමාගම් සමග සමථය සමාප්ත කිරීමට, මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් දෙන ලද විධානය ව්‍යාර්ථ සහ නිෂ්ඵල වීම සහ

(ඈ) මීට අතිරේකව, එයින් 2 වන විත්තිකාර සමාගමට පාඩු සිදු කරමින්, 1995 ජූනි මාසයේදී සමථය ඇති කරන කාලයේදී අපේක්ෂා කල පරිදි පසු අවස්ථාවකදී ඉතිරි කපා නොහැරි ණය මුදල වන ජපන් යෙන් මිලියන 7834 මුදල ඇමරිකන් එක්සත් ජනපද ඩොලර් වලට 2 වන විත්තිකාර සමාගම විසින් පරිවර්තනය කිරීම ද, වළක්වා ඇත.

20. (අ) 1 වන විත්තිකරු විසින් කරන ලද අසත්‍ය ප්‍රකාශ සහ ඇති කරන ලද මතභේද සහ 1 වන විත්තිකරු විසින් සිදු කරන ලද සමථ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම අත්හිටවීම, 2 වන විත්තිකාර සමාගමේ කලින් සභාපති හා කළමනාකාර අධ්‍යක්ෂවරයාව සිටි, දැන් එහි අධ්‍යක්ෂවරයකු වන්නා වූ, සී.එල්.පෙරේරා විසින් පවරන ලද්දා වූ හෝ පැවරීමට සලස්වන ලද්දා වූ 2 වන විත්තිකාර සමාගම හා සම්බන්ධයෙන් අදාළ පීඩාකාරී නඩු කටයුතු ගණනාවකදීම, මැදගත් වන විසඳනාවන් වශයෙන් ව්‍යාප්තිකව උපධානය කර ඇත.

(ආ) සී.එල්.පෙරේරාගේ කෝනල් ඇන්ඩ් කම්පැනි විසින් 1998 මාර්තුවේදී පවරන ලද කොළඹ දිසා අධිකරණයේ අංක.5095/විශේෂ දරන නඩුවේදී සහ මහාධිකරණ බ.ප. (සිවිල්) නඩු අංක. 1/98(2) දරන (දැන් නිශ්ප්‍රභ කර ඇති) නඩුවේදී එහි විත්තිකරුවන් වශයෙන් 2 වන විත්තිකාර සමාගම විසින් සහ රජය විසින් ද විරෝධතා සහ උත්තර ගොනු කරමින් එකී සමථ ගිවිසුම් සුරකිමින්, එමගින්, ඉහත 14 වන ඡේදයේ දක්වා ඇති පරිදි 1 වන විත්තිකරු විසින් කර ඇති ප්‍රකාශය බොරු බව ඔප්පු කර ඇත.

(ඇ) එකී පීඩාකාරී නඩුකර මගින් 2 වන විත්තිකාර සමාගමේ ක්‍රියාකලාපයට සහ කටයුතු වලට දැඩිසේ බාධා කිරීම් සහ එසේම ඊට බලවත් පාඩු හා අලාභ හානි සිදු කරමින් 2 වන විත්තිකාර සමාගම තව තවත් මහජන ආන්දෝලනයකට, ගර්හාවකට හා හානියට යටත් කර ඇත.

21. (අ) 1996 දී සමථ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම සඳහා පැමිණිලිකරුගේ සහයෝගය හා එකඟත්වය පතමින්, සමථ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම සාවද්‍ය ලෙස සහ නීතිවිරෝධී ලෙස අත්හිටවීමට අදාළව 1 වෙනි විත්තිකරු විසින් ඇතිකළ සියලු මතභේද දුරලීම පිණිස රජය විසින් ප්‍රසිද්ධ නිල ප්‍රකාශයක් කරන බවට මුදල් අමාත්‍යාංශයේ/භාණ්ඩාගාරයේ ලේකම් බී.සී.පෙරේරා සහ භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ආචාර්ය පී.බී.ජයසුන්දර විසින්, පැමිණිලිකරුට පොරොන්දුවක් දෙන ලදී.

(ආ) මුදල් අමාත්‍යාංශයේ/භාණ්ඩාගාරයේ ලේකම් විසින් නැවත නැවත කරන ලද සහතිකවීම් තිබුනද එකී මතභේද දුරලීම සඳහා මෙදින දක්වාම එවැනි ප්‍රසිද්ධ ප්‍රකාශයක් කර නැත.

(ඇ) 2 වන විත්තිකාර සමාගමේ වත්මන් සභාපති භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් බී.වයි.ලියනගේ ඉහත දැක්වෙන කරුණු දැනගෙන සිටී.

(ඈ) මාධ්‍යය මගින් ප්‍රචලිත ලෙස වාර්තා කරනු ලැබූ ඉහත කී මතභේද තිබුනද, පැමිණිලිකරු විසින් 1 වන විත්තිකරු වෙත තත් කාරණය ගැන දැනුම්දීමක් කරන ලද්දේ වී නමුත්, 2 වන විත්තිකාර සමාගම දිගින් දිගටම අගතියට ලක් කරමින් තමා විසින් ඇති කරනු ලැබූවා වූ එකී මතභේද දුරලීම පිණිස ඕසියම් ප්‍රසිද්ධ කරුණු පැහැදිළි කිරීමක් කිරීම 1 වන විත්තිකරු විසින් හිතාමතාම දිගටම මඟහරිමින් සිටී.

22./

22. (අ) වෙනත් කරුණු අතර, 1 වන විත්තිකරු විසින් සමථය සාවද්‍ය ලෙස හා නීතිවිරෝධී ලෙස සමථ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම අත්හිටවීම නිසා 2 වන විත්තිකරුට සිදු කෙරෙන පාඩුව, අලාභ හානිය හා උපද්‍රවය ගැන මුදල් අමාත්‍යාංශයේ/භාණ්ඩාගාරයේ ලේකම් වෙත පැමිණිලිකරු විසින් වෙනත් ඉදිරිපත් කිරීම් අතර 97/04/01, 97/04/22, 97/06/13, 97/08/18, 97/10/22, 98/01/30, 98/03/23 හා 98/06/29 යන දිනයන්හිදි ලිඛිත හා වාචික නියෝජනයන් කරන ලදී.

(ආ) පැමිණිලිකරු විසින් ඒ හා සමානම ලිඛිත හා වාචික නියෝජනයන් 2 වන විත්තිකාර සමාගමේ පිළිවෙලින් සභාපති හා අධ්‍යක්ෂ වන බී.වයි.ලියනගේ හා ආචාර්ය පී.බී.ජයසුන්දර යන භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරුන් වෙතද කරන ලද අතර ඉහත සඳහන් කරන ලද ලිඛිත නියෝජනවල පිටපත් ඔවුනට යවන ලදී.

(ඇ) එකී නියෝජනයන් මත කිසිදු ක්‍රියාමාර්ගයක් නොගන්නා ලදී.

23. (අ) 97/02/03 දින සිට බී.වයි.ලියනගේ 2 වන විත්තිකාර සමාගමේ සභාපති ලෙස කටයුතු කරන අතර, ස්ථිර පත්වීමක් කරන තෙක් 2 වන විත්තිකාර සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ තනතුරේ කාර්ය භාරයන්ද ආවරණය කරන ලෙස 97/10/22 වන දින ඔහුට බලය පවරන ලද අතර

(ආ) 2 වන විත්තිකාර සමාගමේ සභාපතිවරයා ලෙස, සමාගම විසින් ඇතුළත් වී ඇති සමථ ගිවිසුම් යටතේ ඉටු කිරීම පිණිස ඉතිරිව ඇති සියලු කරුණු ක්‍රියාත්මක කිරීමට සහ එයින් පැනනගින්නා වූ හා ඊට සම්බන්ධ වූ සියලු අවශ්‍ය ක්‍රියාවන් හා පියවර ගැනීමට, 2 වන විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔහුට බලය පවරා ප්‍රදානය කරන ලදී.

(ඇ) මුදල් අමාත්‍යවරයාගේ විධානය මත, මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 94/09/23 දින දරන ලිපිය මගින්, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවට, විමර්ශණයක් කරන ලෙස නියම කරන ලද අවස්ථාවේදී බී.වයි.ලියනගේ එහි සාමාජිකයකු වූ අතර මෙදින දක්වාම එලෙස දිගටම සිටී - **ඉහත 12 වන ඡේදය පරිදි**

24. (අ) පැමිණිලිකරු විසින් 97/03/18 දින සහ 98/06/15 වන දින දරන සංදේශන මගින්, 1 වන විත්තිකරුගේ ක්‍රියාකලාපය හා ක්‍රියාදාමය නිසා 2 වන විත්තිකාර සමාගමට සිදු වූ පාඩුව, අලාභ හානිය හා උපද්‍රවය ගැන ජනාධිපති කුමාරතුංග මැතිණිය/මුදල් අමාත්‍යවරිය දැනුවත් කර සිටින ලදී.

(ආ) 2 වන විත්තිකාර සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 101 වන ව්‍යවස්ථාවේ නියමයන් අනුව, මුදල් අමාත්‍යවරයා විසින් රජයේ අධ්‍යක්ෂවරයන් නම් කරනු ලැබේ.

25. මුදල් අමාත්‍යාංශයේ/භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත යවන ලද සහ 2 වන විත්තිකාර සමාගමේ සභාපති බී.වයි.ලියනගේ මහතා වෙත පිටපතක් යවන ලද 98/08/12 දින දරන සංදේශය මගින් පැමිණිලිකරු විසින්, 2 වන

විත්තිකාර/

වින්නිකාර සමාගමට සිදු වී ඇති පාඩු හා අලාභ හානි ගෙන හැර දක්වමින්, මෙසේ දැක්වෙන පරිදි ප්‍රකාශ කර සිටින ලදී :- "එච්ඩීඑල් සමාගමේ සහ එහි කොටස් හිමියන්ගේ යහපත උදෙසා රජය විසින් සහ/හෝ එච්ඩීඑල් සමාගම (2 වන වින්නිකාර සමාගම) විසින් ක්‍රියා නොකරන්නේ නම්, මේ කාරණය ගැන නියෝජ්‍ය මුදල් ඇමති ජී.එල්.පීරිස් මහතාට දැනටමත් දැන්වීම් කර ඇති පරිදි, නඩු කටයුතු පැවරීමට සහ/හෝ එච්ඩීඑල් සමාගම ගණන් බේරා වසා දමන ලෙස ඉල්ලා සිටීමට මට අනිවාර්යයෙන්ම සිදුවනු ඇත."

26. (අ) (i) 2 වන වින්නිකාර සමාගමේ 97/07/17 වන දින අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී, පැමිණිලිකරු විසින්, මණ්ඩලීය වාර්තාව අංක.97.7.5 (viii) අනුව - මෙසේ ප්‍රකාශ කර ඇත :-

"රාජ්‍ය ඇපවීම් යටතේ රජය විසින් අරමුදල් අත්හිකාරම් කිරීමට සිදුවීම ගැන එන්.එස්.අමරසේකර මහතා විසින් කණගාටුව ප්‍රකාශ කර සිටිමින්, සමථය ක්‍රියාත්මක කිරීම අත්හිටුවීමෙන් සමාගමට රු.මිලියන 55.0 ක පමණ අතිරේක පොලී වියදමක් දරන්නට සිදුව ඇති බවත්, සමථ ගිවිසුම්වල විධිවිධාන සලසා ඇති පරිදි සමාගමේ ණය සේවා කිරීමේ ශක්තිය වර්ධනය කිරීම පිණිස සහ 3 වන හෝටල් කාමර කුළුණ ඉදි කිරීම පිණිස ක්ෂමා කාලය තුළදී ගත යුතුව තිබුණු මූල්‍ය ප්‍රතිව්‍යුහකරණ ක්‍රියාදාමය ව්‍යර්ථ කර ඇති බවත්, වාර්තා කර තැබීමට ඔහුට අවශ්‍ය කෙරුනි. ජේඒඅයිසී (JAIC) කුළුණෙහි හිල්ටන් කළමනාකරණය මගින් 3 වන කුළුණක් සඳහා උපාය මාර්ගයක ඇති අවශ්‍යතාවය දැඩිලෙස පෙන්නුම් කර දී ඇති අතර, එය දැන් සමාගමේ පසුබෑස්මක් බව අමරසේකර මහතා තරයේ කියා සිටියේය."

(ii) 2 වන වින්නිකාර සමාගමේ කිසිදු අධ්‍යක්ෂවරයෙක් ඊට විරුද්ධ නොවීය.

(ආ) (i) 98/09/04 වන දින පැවති 2 වන වින්නිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී, පැමිණිලිකරු විසින්, 1 වන වින්නිකරුගේ ක්‍රියාකලාපය හා ක්‍රියාදාමය නිසා 2 වන වින්නිකාර සමාගමට සිදුව ඇති පාඩු හා අලාභ හානි පෙන්නුම් කෙරෙන 98/09/04 දිනැති සංදේශනයක් සභාගත කරන ලදී. එසේ කරමින් පැමිණිලිකරු මෙලෙස කියා සිටියේය :- "ඉහත කී අවස්ථානුගත කරුණු නිසා, සමාගමේ සහ එහි කොටස්හිමියන්ගේ යහපත උදෙසා, සමාගමට සිදු වූ පාඩු සහ අලාභ හානි අයකර ගැනීම පිණිස නියෝජ්‍ය මුදල් ඇමති ජී.එල්.පීරිස් මහතාට විරුද්ධව ක්‍රියාමාර්ගයක් ගත යුතුව ඇත."

(ii) ඊළඟ මණ්ඩලීය රැස්වීමේදී මෙම කාරණය ගැන ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස පැමිණිලිකරු ඉල්ලා සිටියේය.

(ඇ)/

(ඈ) (i) ඉනික්බිති පැමිණිලිකරු විසින්, 2 වන විත්තිකාර සමාගමේ අනිකුත් රජයේ නාමිත අධ්‍යක්ෂවරයන් වෙත පිටපත් සහිතව, 2 වන විත්තිකාර සමාගමේ සභාපති බී.වයි.ලියනගේ වෙත 98/09/21 දාතමින් සංදේශයක් ඉදිරිපත් කර සිටින ලදී. එහි, වෙනත් දේ අතර, මෙසේ සඳහන් කර සිටින ලදී :-

"එච්ඩීඑල් සමාගමට සිදු වූ ඉහත කී පාඩුව, හානිය හා වාර්ථ කිරීම නිසා, මවිසින්, එච්ඩීඑල් සමාගමේ 98 සැප්තැම්බර් මස 04 වන දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී 98/09/04 දින දරන සංදේශය සභාගත කරන ලදී. එච්ඩීඑල් සමාගමේ සහ එහි කොටස්හිමියන්ගේ සහපත උදෙසා, අවශ්‍යයෙන්ම ඒ ගැන වහාම ක්‍රියා කළ යුතු බව මම කියා සිටිමි. එච්ඩීඑල් සමාගම වූ කලී රජයට අයත්, ලැයිස්තුගත කළ පොදු සමාගමක් වන අතර, එකී කරුණු දැඩි සහ බරපතල ස්වභාවයේ ඒවා වන අතර නැවත සලකා බැලීමක් කිසිසේත් අවශ්‍ය නොවන, එහෙත් අප්‍රමාදව ක්‍රියා කිරීමට තුඩු දෙන කාරණා වේ."

(ii) පැමිණිලිකරු, 2 වන විත්තිකාර සමාගමේ සභාපති බී.වයි.ලියනගේ ඇමතූ 98/10/13 වන දින දරන සංදේශයක් මගින් ලුහුබඳිමින්, ඊළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණයක් ගැනීම, අත්‍යාවශ්‍ය වන හා ඉතා හදිසි කාරණයන් බව තරයේම දන්වා සිටියේය.

(ඇ) (i) 98/10/14 වන දින පැවැත් වූ ඊළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී 97/07/17 වන දින අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ වාර්තාව (ඉහත 26(අ)(i) පරිදි) පැමිණිලිකරු විසින් කියවන ලද අතර, එහි අධ්‍යක්ෂවරුන් වෙත බෙදාහැර ඇති 98/09/04 දිනැති තමාගේ සංදේශය ගැන ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙස තරයේම ඉල්ලා සිටින ලදී.

(ii) සභාපති බී.වයි.ලියනගේ විසින් මෙම කාරණය 2 වන විත්තිකාර සමාගමේ නීතිඥවරුන් වෙත යොමු කිරීමට යෝජනා කරන ලද අතර, මෙම කාරණය 98/10/28 වන දිනට ප්‍රථමයෙන් ක්‍රියා කිරීම අවශ්‍ය හදිසි කාරණයක් බව පැමිණිලිකරු විසින් තරයේම කියා සිටින ලදුව, ඒ ගැන ක්‍රියා කිරීම පිණිස පසුදින තමාට ඒ ගැන මතක් කරන ලෙස සභාපතිවරයා විසින් 2 වන විත්තිකාර සමාගමේ ලේකම්වරුන්ට දන්වා සිටින ලදී.

(ඉ) ඒ අනුව, පැමිණිලිකරු විසින් වහාම 98/10/15 දින දරන ලිපි පහත දැක්වෙන අය වෙත ඉදිරිපත් කරන ලදී :-

(i) 2 වන විත්තිකාර සමාගමේ ලේකම්වරුන් වන කෝපරේට් සර්විසස් ලිමිටඩ් වෙත.

(ii) 2 වන විත්තිකාර සමාගමේ නීතිඥවරුන් වන එෆ්.ජේ.සහ ජී. ද සේරම් නීතිඥ සමාගම වෙත.

2 වන විත්තිකාර සමාගමේ සභාපති ඩී.වයි.ලියනගේ වෙත එහි පිටපත් පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර සිටිමින්, 2 වන විත්තිකාර සමාගමේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම පිණිස 98/10/28 වන දිනට කලින් වහාම ක්‍රියාත්මක වීම අවශ්‍ය බව තරයේම පෙන්වා දෙන ලදී.

(ඡ) 2 වන විත්තිකාර සමාගමේ ලේකම්වරුන් වන කෝපරේට් සර්විසස් ලිමිටඩ් සමාගමෙන් විමසන ලදුව, පැමිණිලිකරුට දැනුම් දෙනු ලැබුවේ, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ වාර්තාව තමා විසින් අනුමත කරන තෙක් මෙම කාරණය 2 වන විත්තිකාර සමාගමේ නීතිඥවරුන් වෙත යොමු නොකරන ලෙස සභාපති ඩී.වයි.ලියනගේ විසින් ලේකම්වරුන්ට උපදෙස් දී තිබෙන බවත්, 98/10/14 වන දින අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ කෙටුම්පත් වාර්තාව 98/10/16 වන දින ඔවුන් විසින් ඔහු වෙත යවනු ලබන බවත්ය.

(ළ) එහි ප්‍රතිඵලයක් වශයෙන් පැමිණිලිකරු විසින් 98/10/16 වන දින දරන තවත් සංදේශයක් 2 වන විත්තිකාර සමාගමේ සභාපති ඩී.වයි.ලියනගේ වෙත එහි පිටපත් ආචාර්ය පී.බී.ජයසුන්දර සහ 2 වන විත්තිකාර සමාගමේ අනිකුත් රජයේ නාමික අධ්‍යක්ෂවරයන් වෙත පිටපත් සහිතව යවමින්, අප්‍රමාදව ක්‍රියා කිරීමේ ඇති අවශ්‍යතාවය හා කාරණයේ බරපතලකම ගැන නැවත හුවා දක්වා සිටින ලදී. තවද මෙම කාරණය වහාම 2 වන විත්තිකාර සමාගමේ නීතිඥවරුන් වෙත යොමුකර සිටින ලෙසද, නීතියට අනුව කාලාවරෝධී වීම වැළැක්වීම පිණිස ගත යුතු ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට හදිසි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් කැඳවන ලෙසත් ඉල්ලා සිටින ලදී.

(ළා) 98/10/23 වන දින තෙක් මෙම කාරණය 2 වන විත්තිකාර සමාගමේ නීතිඥවරුන් වෙත යොමුකර හෝ හදිසි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් හෝ කැඳවා නොමැත. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ වාර්තා කෙටුම්පත 98/10/16 වන දින ඔවුන් විසින් 2 වන විත්තිකාර සමාගමේ සභාපති වෙත යවා ඇති බව පැමිණිලිකරුට 2 වන විත්තිකාර සමාගමේ ලේකම්වරුන් විසින් ස්ථිර කොට ඇත.

27. (අ) 2 වන විත්තිකාර සමාගමේ වත්මන් අධ්‍යක්ෂවරයෝ වන්නේ :-

(i) රජයේ නාමික අධ්‍යක්ෂවරයන් -

ඩී.වයි.ලියනගේ,
ආචාර්ය පී.බී.ජයසුන්දර,
පද්මා මහාරාජා සහ
පැමිණිලිකරු
1997 ඔක්තෝබර් සහ 1998 මාර්තු සිට පුරප්පාඩු 2 ක් ඇත.

(ii) මිට්සුයි හා තායිසේ නාමික අධ්‍යක්ෂවරු -

කේ.කොජිමා හා ඩී.කොන්බෝ.

(iii) කෝනල් ඇන්ඩ් කම්පැනි ලිමිටඩ් නාමික අධ්‍යක්ෂවරු -

සී.එල්.පෙරේරා සහ
ටී.පී.පෙරේරා.

(iv)/

(iv) අනිත් අධ්‍යක්ෂවරයා - 97 ජූලි සිට පුරප්පාඩු වී ඇත.

(ආ) 1 වන විත්තිකරු බලපෑම් කළ හැකි හා බලගතු කැබිනට් ඇමතිවරයකු වන බැවින් සහ මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන් ඔහුගේ කාර්ය පථයට වැටෙන බැවින්, විශේෂයෙන්ම 2 වන විත්තිකාර සමාගමේ සභාපති ඩී.වයි.ලියනගේ සමග පැවැති සාකච්ඡා තුලින් පැමිණිලිකරු තරයේ විශ්වාස කරනුයේ, පැමිණිලිකරුගේ නියෝජනයන් මත ක්‍රියා නොකලාක් මෙන්ම, 1 වෙනි විත්තිකරුට විරුද්ධව ක්‍රියා කිරීමට ඔවුන් අසරණ වන අතර, ක්‍රියා කිරීමට ඔවුන්ට නොහැකි බවයි.

(ඇ) තවද, මිට්සුයි සහ තායිසේ සමාගම්වල අධ්‍යක්ෂවරයන්ද 1 වන විත්තිකරුට විරුද්ධව ක්‍රියා නොකරනු ඇතැයි පැමිණිලිකරු දැඩිලෙස විශ්වාස කරයි.

(ඈ) 1 වන විත්තිකරුගේ ක්‍රියාකලාපය හා ක්‍රියා සම්බන්ධයෙන් 2 වන විත්තිකාර සමාගමේ අගතියට හේතුවන ආකාරයෙන් ඒවා තහවුරු කරමින් වූ නඩු කටයුතු වලදී උපධානය කිරීම නිසා, කෝනල් ඇන්ඩ් කම්පැනි ලිමිටඩ් සමාගමේ නාමිත අධ්‍යක්ෂවරයෝ, 2 වන විත්තිකාර සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 123 වන ව්‍යවස්ථාව අනුව මේ කාරණයේදී තීරණයක් ගැනීමෙහි ලා සහභාගී වීමට නුසුදුස්සෝ වී සිටිති.

28. (අ) 1 වන විත්තිකරු විසින් ඇති කරන ලද මතභේදවල හා ඒවා මත පදනම් වූ පීඩාකාරී නඩු කටයුතුවල ප්‍රතිඵලයක් වශයෙන්, වෘත්තිකයකු වශයෙන් මෙන්ම 2 වන විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂවරයකු වශයෙන්ද පැමිණිලිකරු විසින්, 2 වන විත්තිකාර සමාගමේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමෙහිලා සහ සුරැකීමෙහිලා සෑහෙන කාලයක් සහ බලවත් උත්සාහයක් දරා ඇත. එසේම, මීට කලින්ද ඒ අරමුණ උදෙසා එවැනිම ආකාරයෙන් සෑහෙන කාලයක් හා වැයමක් පැමිණිලිකරු විසින් දරා ඇති අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් 2 වන විත්තිකාර සමාගමට බොහෝ ලාභ ප්‍රයෝජන අත්විය. ඉහත 9 වන ඡේදය පරිදි.

(ආ) මෙම කරුණු පදනම හේතුකොට ගෙන 2 වන විත්තිකාර සමාගමේ පාලනයේ ස්වරූපය අනුව, 2 වන විත්තිකාර සමාගමේ සහ එහි කොටස්හිමියන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සහ 2 වන විත්තිකාර සමාගමේ සහ එහි කොටස්හිමියන්ගේ යහපත උදෙසාත් පැමිණිලිකරු වශයෙන් 2 වන විත්තිකාර සමාගම නාමයෙන් 1 වන විත්තිකරුට එරෙහිව කිසිදු නීති කෘත්‍යයක් ගෙන ඒමට නුපුළුවන් වනු සහ/හෝ ගෙන නොඑනු ඇත.

(ඇ) ඉහත කී අවස්ථානුගත කරුණු යටතේ 2 වන විත්තිකාර සමාගමේ කොටස්හිමියකු තත්ත්වයෙන් 2 වන විත්තිකාර සමාගමේ සහ එහි කොටස්හිමියන්ගේ යහපත සඳහාත්, 2 වන විත්තිකාර සමාගමේත් එහි කොටස්හිමියන්ගේත්, අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම පිණිස 2 වන විත්තිකාර සමාගමේ අයිතියෙන් එය සඳහා සහ එය වෙනුවෙන් මේ නඩුව අනිවාර්යයෙන්ම පවරා තිබිය යුතු කටයුත්තක් බවට පත් වී තිබේ.

(ඇ) 1 වන විත්තිකරුට විරුද්ධව කරනු ලබන ඉල්ලීම් වලින් කොටසක් 2 වන විත්තිකාර සමාගමට සහ එහි කොටස්හිමියන්ට අහිතකර ලෙස කාලාවරෝධ වන බැවින්, 2 වන විත්තිකරුගේ හා එහි කොටස්හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිණිස මෙම නඩුව තවදුරටත් ප්‍රමාද නොකර, 1998/10/28 වන දිනට හෝ ඊට ප්‍රථමයෙන්, පැවරීමට සිදුව ඇත.

29. (අ) 1 වන විත්තිකරු ඔහුගේ නිල තත්ත්වයෙන් ක්‍රියා කිරීමට උද්දේශිතව ඇති බව සැලකිල්ලට ගෙන, පැමිණිලිකරු විසින් සිවිල් නඩු විධාන සංග්‍රහයේ 461 වන වගන්තිය අනුව ක්‍රියා කරමින්, ඔහුගේ නීතිඥවරයාගේ මාර්ගයෙන් යවන ලද 98/09/21 වන දින දරන ලිපිය මගින් 1 වන විත්තිකරු වෙත දැන්වීමක් කරන ලද අතර, 1 වන විත්තිකරු විසින් ඔහුගේ නීතිඥවරුන්ගේ මාර්ගයෙන් 98/09/30 වන දින දරන ලිපිය මගින් ඊට පිළිතුරු දී ඇත.

(ආ) පැමිණිලිකරුගේ ලිපියෙන් දක්වන ලද නොයෙකුත් කරුණු 1 වන විත්තිකරු විසින් ප්‍රතික්ෂේප කිරීමක් සහ/හෝ ඒවාට හබ කිරීමක් කර නැති නමුත් හුදෙක් ඒ සඳහා නෛතික වගකීම පමණක් ප්‍රතික්ෂේප කර ඇත.

30. ඉහත කී කරුණු පදනමින්, 2 වන විත්තිකාර සමාගමේ සහ එහි කොටස්හිමියන්ගේ අයිතියෙන් 2 වන විත්තිකාර සමාගමේ සහ එහි කොටස්හිමියන්ගේ යහපත සඳහා සහ 2 වන විත්තිකාර සමාගමේ සහ එහි කොටස්හිමියන් වෙනුවෙන් අලාභ හානි අයකර ගැනීම සඳහා 1 වන විත්තිකරුට විරුද්ධව නඩු පැවරීම පිණිස 2 වන විත්තිකාර සමාගමේ කොටස්හිමියකුගේ තත්ත්වයෙන් පැමිණිලිකරුට නඩු නිමිත්තක් උපචිත වී ඇත :- එනම්

(අ) ඕවිසූයි සහ තායිසේ සමාගම් වලට 96/10/29 වන දින හා 96/11/14 වන දින ගෙවන ලද අතිරේක පොලිය කරණකොට ගෙන, රුපියල් තුන් කෝටි පනස් නවලක්ෂ තිස්අට දහසක (රු. 3,59,38,000/-) මුදලක්ද පැමිණිල්ලේ දිනය දක්වා ඒ මත නෛතික පොලියද ඉන්පසු තීන්දු ප්‍රකාශයේ දිනය දක්වා නෛතික අනුප්‍රමාණය අනුව පොලියද ඉනික්බිති මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් කරන තෙක් තීන්දු ප්‍රකාශිත මුදල මත නෛතික අනුප්‍රමාණය අනුව පොලියද සහිතව 1 වන විත්තිකරුගෙන් අයකර ගැනීම සඳහාත්,

(ආ) 2 වන වින්තිකාර සමාගමට 97/07/01 වන දින රජය විසින් ප්‍රදානය කරන ලද රු.මිලියන 288.567 ක ණය මුදල සඳහා 98/06/30 වන දින දක්වා දරන්නට සිදුවුනු පොලිය වන රුපියල් තුන්කෝටි හැටලක්ෂ හැත්තෑ එක්දහසක (රු.3,60,71,000/-) මුදලක්ද එකී ණය මුදල සම්පූර්ණයෙන් පියවා නිදහස් කර අවසාන වශයෙන් බේරුම් කරන තෙක් ඒ මත අඛණ්ඩව ගෙවිය යුතු පොලියද, ගෙවීමේ දිනයේ සිට තීන්දු ප්‍රකාශයේ දිනය දක්වා යම් පොලි ගෙවීමක් වෙතොත් ඒ මත නෛතික අනුප්‍රමාණය අනුව පොලියද, ඉනික්බිති මුදල් සම්පූර්ණයෙන් ගෙවා අවසන් කරන තෙක් නෛතික අනුප්‍රමාණය අනුව තීන්දු ප්‍රකාශිත මුදල මත පොලියද, සහිතව, 1 වන වින්තිකරුගෙන් අයකර ගැනීම සඳහාත්,

(ඇ) 2 වන වින්තිකාර සමාගමේ ලාභදායිතාවය සහ ණය සේවා ශක්තිය වර්ධනය කිරීම පිණිස - එහෙත් 96/07/01 දින සිට වසර පහ (5) කට සීමා කරමින් :

(i) සමථ ගිවිසුම් වලින් අරමුණු කරන ලද පරිදි 2 වන වින්තිකාර සමාගමේ මූල්‍ය ප්‍රතිව්‍යුහකරණ කිරීමෙන්ද,

(ii) ඉතිරි කපා නොහැරී ජපන් යෙන් ණය මුදල එක්සත් ජනපද ඩොලර් වලට පරිවර්තනය කිරීමෙන්ද ඇතුළුව,

(iii) 3 වන හෝටල් කාමර කුළුණ ඉදි කිරීමේ කටයුතු කිරීමෙන්ද,

2 වන වින්තිකාර සමාගම වළක්වාලීමෙන්, 2 වන වින්තිකාර සමාගමට සිදු වූ අලාභ හානි කරණකොට ගෙන, අධිකරණය විසින් නිශ්චය හා සොයා දැනගෙන තීරණය කරනු ලබන වැඩිදුර මුදල් ප්‍රමාණයක්, එම මුදල් ප්‍රමාණය ගෙවා අවසන් කරන තෙක් තීන්දු ප්‍රකාශිත මුදල මත නෛතික අනුප්‍රමාණය අනුව තීන්දු ප්‍රකාශිත මුදල මත පොලියද, සහිතව, 1 වන වින්තිකරුගෙන් අයකර ගැනීම සඳහාත්,

(ඈ) ඉහත 30(අ), (ආ) සහ (ඇ) ඡේදයන්හි සඳහන් මුදල් ප්‍රමාණයන් 2 වන වින්තිකාර සමාගමට ගෙවන ලෙස 1 වන වින්තිකරුට විධානය කරමින් නියෝගයක් සඳහාත්, ය.

31. මුද්දර ගාස්තුවල කාර්ය සඳහා පැමිණිලිකරු මෙම නඩුවේ වටිනාකම රු.100,000,000/- ක් ලෙස තක්සේරු කරයි.

එමනිසා/

එමනිසා, පැමිණිලිකරු අයැද සිටිනු ලබන්නේ :

(අ) මිට්සුයි සහ තායිසේ සමාගම් වලට 96/10/29 වන දින හා 96/11/14 වන දින ගෙවන ලද අතිරේක පොලිය කාරණකොට ගෙන, රුපියල් තුන් කෝටි පනස් නවලක්ෂ තිස්අට දහසක (රු.3,59,38,000/-) මුදලක්ද පැමිණිල්ලේ දිනය දක්වා ඒ මත නෛතික පොලියද ඉන්පසු තීන්දු ප්‍රකාශයේ දිනය දක්වා නෛතික අනුප්‍රමාණය අනුව පොලියද ඉනික්බිති මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් කරන තෙක් තීන්දු ප්‍රකාශිත මුදල මත නෛතික අනුප්‍රමාණය අනුව පොලියද සහිතව 1 වන විත්තිකරුගෙන් අයකර ගැනීම සඳහා විධානය කරමින් ඔහුට විරුද්ධව නඩු තීන්දුවක් ද, ,

(ආ) 2 වන විත්තිකාර සමාගමට 97/07/01 වන දින රජය විසින් ප්‍රදානය කරන ලද රු.මිලියන 288.567 ක ණය මුදල සඳහා 98/06/30 වන දින දක්වා දරන්නට සිදුවුනු පොලිය වන රුපියල් තුන්කෝටි හැටලක්ෂ හැත්තෑ එක්දහසක (රු.3,60,71,000/-) මුදලක්ද එකී ණය මුදල සම්පූර්ණයෙන් පියවා නිදහස් කර අවසාන වශයෙන් බේරුම් කරන තෙක් ඒ මත අඛණ්ඩව ගෙවිය යුතු පොලියද, ගෙවීමේ දිනයේ සිට තීන්දු ප්‍රකාශයේ දිනය දක්වා යම් පොලී ගෙවීමක් වේනොත් ඒ මත නෛතික අනුප්‍රමාණය අනුව පොලියද, ඉනික්බිති මුදල් සම්පූර්ණයෙන් ගෙවා අවසන් කරන තෙක් නෛතික අනුප්‍රමාණය අනුව තීන්දු ප්‍රකාශිත මුදල මත පොලියද, සහිතව, 1 වන විත්තිකරුගෙන් අයකර ගැනීම සඳහා විධානය කරමින් ඔහුට විරුද්ධව නඩු තීන්දුවක් ද,

(ඇ) 2 වන විත්තිකාර සමාගමේ ලාභදායිතාවය සහ ණය සේවා ශක්තිය වර්ධනය කිරීම පිණිස - එහෙත් 96/07/01 දින සිට වසර පහ (5) කට සීමා කරමින් :

(i) සමථ ගිවිසුම් වලින් අරමුණු කරන ලද පරිදි 2 වන විත්තිකාර සමාගමේ මූල්‍ය ප්‍රතිව්‍යුහකරණ කිරීමෙන්ද,

(ii) ඉතිරි කපා නොහැරී ජපන් යෙන් ණය මුදල එක්සත් ජනපද ඩොලර් වලට පරිවර්තනය කිරීමෙන්ද ඇතුළුව,

(iii) 3 වන හෝටල් කාමර කුළුණ ඉදි කිරීමේ කටයුතු කිරීමෙන්ද,

2 වන/

2 වන විත්තිකාර සමාගම වළක්වාලීමෙන්, 2 වන විත්තිකාර සමාගමට සිදු වූ අලාභ හානි කරණකොට ගෙන, අධිකරණය විසින් නිශ්චය කරනු ලබන හා සොයා දැනගෙන තීරණය කරනු ලබන වැඩිදුර මුදල් ප්‍රමාණයක්, එම මුදල් ප්‍රමාණය ගෙවා අවසන් කරන තෙක් තීන්දු ප්‍රකාශිත මුදල මත නෛතික අනුප්‍රමාණය අනුව තීන්දු ප්‍රකාශිත මුදල මත පොලියද සහිතව, 1 වන විත්තිකරුගෙන් අයකර ගැනීම සඳහා විධානය කරමින් ඔහුට විරුද්ධ නඩු තීන්දුවක් ද,

(ඈ) ඉහත (අ), (ආ) සහ (ඇ) ආයාචනයන්හි සඳහන් මුදල් ප්‍රමාණයන් 2 වන විත්තිකාර සමාගමට ගෙවන ලෙසට 1 වන විත්තිකරුට විධානය කරමින් නියෝගයක් සඳහාත්,

(ඉ) නඩු ගාස්තු සහ

(ඊ) මෙම අධිකරණයට සුදුසු යයි හැඟෙන වෙනත් සහ තවදුරටත් වූ සහන සඳහාත්, ය.

පැමිණිලිකරුගේ නීතිඥ.